නාලන්දා විද්‍යාලය - කොළඹ 10

ඒකක පරීක්ෂණය

10/11 ශ්‍රේණි	සිංහල සාහිත්‍ය රසාස්වාදය	ඒකකය 11 - මඟ විසිතුරු

(1) අසා ඇති ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

i) මෙම සඳහන් කවි පන්තිය කුමන සංදේශ කාව්‍යයකට අයත් ද?
ii) එම සංදේශ කාව්‍ය රචකයා කවුරුන් ද?
iii) එය ලියා ඇත්තේ කිනම් සාහිත්‍ය යුගයක දී ද?
iv) මෙහි නිර්මාණකරු හඳුන්වන ගෞරවණීය නම සඳහන් කරන්න.
v) එහි නිර්මාණකරු අධිපතීත්වය දැරූ පිරිවෙනෙහි නම සඳහන් කරන්න.
vi) මෙම සංදේශ කාව්‍යයේ නිමිත්ත වූයේ කුමක් ද?
vii) මේ නිර්මාණය රචිත යුගයේ මෙරට විසූ පාලකයා කවුරුන් ද?
viii) මේ සාහිත්‍ය ග්‍රන්ථයේ ඇති මුළු කවි ගණන කොපමණ ද?
ix) මේ නිර්මාණයෙහි රචකයා ලියූ වෙනත් සාහිත්‍ය නිර්මාණ දෙකක් නම් දක්වන්න.
x) ලංකා ඉතිහාසයේ පැරණි සංදේශ කාව්‍ය හා එය ලියා ඇති යුගය සඳහන් කරන්න.

(2) පහත සඳහන් ප්‍රශ්න සඳහා කෙටි සටහන් ඉදිරිපත් කරන්න.

i) මේ පද්‍ය පන්තියෙන් හෙළිවන විවිධ සමාජ ආර්ථික තත්ත්වය.
ii) ස්වභාව සෞන්දර්ය වර්ණනා කිරීමට කවියා යොදාගෙන ඇති කාව්‍ය උපක්‍රම.
iii) දූතයාගේ ගමන් මඟෙහි වූ චමත්කාරජනක බව.

3) විචාර ප්‍රශ්න

1) i) අනුප්‍රාසය හා
ii) උපමා භාවිතය ඖචිත්‍යයෙන් යුතුව භාවිත කිරීම මෙම සංදේශයේ සාර්ථකත්වය හේතු විය. පහදන්න.

(එකකට උදාහරණ දෙක බැඟින් වචන 125 ක් සෑහේ)

2) මඟ වැනුම පද්‍ය පන්තිය ස්වභාවෝක්තියට මුල් තැන දෙමින් වර්ණනාවට හසු කර ඇති අයුරු පැහැදිලි කරන්න.

(උදාහරණ තුනක් ගෙන වචන 100ක් වන සේ ලිවිය යුතුය.)

සැකසුම:- *දයානන්ද ගම්මන්පිල මයා*